᠎# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2264/58 – 2022 ජනවාරි මස 27 වැනි බ්‍රහස්පතින්දා – 2022.01.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2021 අංක 230 දරන ආඥාව**

මගේ අංකය: 4-3/4/2020/LRB/181.
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරිගේ යොමු අංකය:
KSWD&EIP/ACQ/DWC/02.

අංක 2253/19 හා 2021.11.10 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළමු පිටුවෙහි සිංහල හා ඉංග්‍රීසි භාෂාවෙන් කරන ලද 2021 අංක 230 දරන ආඥාවේ 1 උපලේඛනයෙහි ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී ''වේරස්ගඟ සංවර්ධන ව්‍යාපෘතිය'' යන්න වෙනුවට ''කොලොන්නාව සංවර්ධන ව්‍යාපෘතිය'' යන්න ලෙස ද, සිංහල භාෂාවෙන් සකස් කරන ලද ආඥාවේ ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී යොමු අංකය ''KSWD&EIP/ACQ/DWC 07'' යන්න වෙනුවට ''KSWD&EIP/ACQ/DWC 02'' යන්න ලෙස ද, එකී ආඥාවේ 1 උපලේඛනයෙහි කැබලි විස්තරය යටතේ අංක 02 ''කැබලි අක්ෂර B ප්‍රමාණය: හෙක්. 0.0498'' යන්න ''කැබලි අක්ෂර B ඉඩමේ නම සඳහන් නොවේ - ප්‍රමාණය: හෙක්. 0.0498'' යන්න ලෙස ද අංක 03 කැබලි අක්ෂර C හි දකුණට ''කිත්තම්පහුව පාරේ සොයාගත නොහැකි සැනොවින් උත්සව ශාලාව පිහිටි ඉඩම'' යන්න ''කිත්තම්පහුව පාරේ වරිපනම් අංක සොයාගත නොහැකි සැනොවින් උත්සව ශාලාව පිහිටි ඉඩම'' යන්න ලෙස ද නිවැරදි විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

2022 ජනවාරි මස 15 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 01 - 0301

1A – G 35937 – 55 (2022/01)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2022 අංක 17 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/13/2020/PC/26.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: PTB/LND/Acqvi/07/50.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට *නැතහොත්,* එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

2022 ජනවාරි මස 15 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි. –** ප්‍රාදේශීය ලේකම්, පිටබැද්දර.

2. **ඉඩමේ විස්තරය.–** දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මොරවක් කෝරළේ සුළු කොට්ඨාසයේ, වැලිව (අ.ග.පි. 10) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක MA/PTB/2020/547 හා 2020.12.09 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' - පිටලියද්ද - ප්‍රමාණය: හෙක්. 0.6073ක් පමණ**

උතුරට: මාර්ගය (ප්‍රාදේශීය සභා), පී. වෛද්‍යරත්න හිමිකම් කියන පිටලියද්ද, ආර්. පී. එල්. ගුරුගේ හිමිකම් කියන පිටලියද්ද, පී. සී. එල්. ගුරුගේ හිමිකම් කියන පිටලියද්ද සහ තිලක් චන්දන ගුරුගේ හිමිකම් කියන පිටලියද්ද; නැගෙනහිරට: පී. වෛද්‍යරත්න හිමිකම් කියන පිටලියද්ද, ආර්. පී. එල්. ගුරුගේ හිමිකම් කියන පිටලියද්ද, පී. සී. එල්. ගුරුගේ හිමිකම් කියන පිටලියද්ද සහ තිලක් චන්දන ගුරුගේ හිමිකම් කියන පිටලියද්ද, මාර්ගය (මා.සං.අ.), එච්. එන්. මවුදාස හිමිකම් කියන පිටලියද්ද, අයි. එන්. ජී. පියසීලි හිමිකම් කියන පිටලියද්ද, හෂාන් තරංග අබේවික්‍රම හිමිකම් කියන පිටලියද්ද සහ සී. කේ. මල්ලවගේ හිමිකම් කියන හල්විටිගලවත්ත; දකුණට: එච්. එන්. මවුදාස හිමිකම් කියන පිටලියද්ද, අයි. එන්. ජී. පියසීලි හිමිකම් කියන පිටලියද්ද, හෂාන් තරංග අබේවික්‍රම හිමිකම් කියන පිටලියද්ද සහ සී. කේ. මල්ලවගේ හිමිකම් කියන හල්විටිගලවත්ත සහ පී. කේ. වීරමන් හිමිකම් කියන හල්විටිගලවත්ත; බටහිරට: සී. කේ. මල්ලවගේ හිමිකම් කියන හල්විටිගලවත්ත සහ පී. කේ. වීරමන් හිමිකම් කියන හල්විටිගලවත්ත සහ හන්තාගේ ධම්ම ගවේසී හිමි හිමිකම් කියන මොරවකවත්ත.

EOG 01 - 0302

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2022 අංක 18 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/8/2015/PC/141.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 4/2/1/67.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට *නැතහොත්,* එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

2022 ජනවාරි මස 15 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී. –** ප්‍රාදේශීය ලේකම්, දොම්පෙ.

2. **ඉඩමේ විස්තරය.–** බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගඟබඩපත්තුව සුළු කොට්ඨාසයේ, 390C, කිතුලකන්ද, රදාවාන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, රදාවාන ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක ගම්/දොම්/2016/256 හා 2016.11.11 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කොටස් තුනට (03) මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – කෝන්ගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0002 ක් පමණ**

උතුරට සහ නැගෙනහිරට: ලියනගේ ඇඩී හිමිකම් කියන කෝන්ගහවත්ත; දකුණට: මාර්ගය සහ කැබලි අක්ෂර B; බටහිරට: කැබලි අක්ෂර B, එස්. ඒ. රංජිත් නිශාන්ත සහ එස්. ඒ. නිහාල් ගාමිණි හිමිකම් කියන කහටගහවත්ත.

02. **කැබලි අක්ෂර 'B' – කහටගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0134 ක් පමණ**

උතුරට: එස්. ඒ. රංජිත් නිශාන්ත සහ එස්. ඒ. නිහාල් ගාමිණි හිමිකම් කියන කහටගහවත්ත, ලියනගේ ඇඩී හිමිකම් කියන කෝන්ගහවත්ත සහ කැබලි අක්ෂර A; නැගෙනහිරට: කැබලි අක්ෂර A සහ මාර්ගය; දකුණට: මාර්ගය සහ ප්‍රාදේශීය සභා මාර්ගය; බටහිරට: ප්‍රාදේශීය සභා මාර්ගය, එස්. ඒ. රංජිත් නිශාන්ත සහ එස්. ඒ. නිහාල් ගාමිණි හිමිකම් කියන කහටගහවත්ත.

03. **කැබලි අක්ෂර 'C' – කහටගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0125 ක් පමණ**

උතුරට: මාර්ගය; නැගෙනහිරට: මාර්ගය සහ බී. ජී. සරත් ප්‍රේමචන්ද්‍ර, බී. ජී. තුසිතා ශ්‍යාමලී සහ ඒ. එම්. ඒ. ඥානවතී හිමිකම් කියන කහටගහවත්ත; දකුණට: බී. ජී. සරත් ප්‍රේමචන්ද්‍ර, බී. ජී. තුසිතා ශ්‍යාමලී සහ ඒ. එම්. ඒ. ඥානවතී හිමිකම් කියන කහටගහවත්ත සහ ප්‍රාදේශීය සභා මාර්ගය; බටහිරට: ප්‍රාදේශීය සභා මාර්ගය සහ මාර්ගය.

EOG 01 - 0303

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.